මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ (''ආයතනය'') 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජංගම නොවන වගකීම් ලෙස දැක්විය යුතු රු. 2,458,479 ක් වූ සේවක ණය චක්‍රීය අරමුදල් ශේෂය, රු.850,310 ක් වූ අනෙකුත් දායකත්ව හා රු.60,754,680 ක් වූ විලම්බිත ආදායම් ශේෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 95 ඡේදයට පටහැනිව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශුද්ධ වත්කම්/ හිමිකම් ලෙස දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි සේවක ණය චක්‍රීය අරමුදල හා විලම්බිත ආදායම් ජංගම නොවන වගකීම් ලෙස දැක්වීමට කටයුතු කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව ජංගම නොවන වගකීම් ලෙස දැක්විය යුතු අයිතම නිවැරදිව ඒ යටතේ දැක්විය යුතුය.
(ආ)	පූර්ව කාලපරිච්ඡේද වැරදි නිවැරදි කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි 47 ඡේදය ප්‍රකාරව වරද සිදුවූ කාලපරිච්ඡේදය සඳහා සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කළයුතු වුවත් ආයතනය විසින් එකතුව රු.6,157,875 ක් වූ ඉකුත් කාලපරිච්ඡේද වැරදි 13 ක් නිවැරදි කිරීමේදී සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කර නොතිබුණි.	2025 වර්ෂයේ සිට ඉකුත් කාලච්ඡේද වැරදි සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ලැබේ.	ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පූර්ව කාලපරිච්ඡේද වැරදි නිවැරදි කිරීමේදී වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කළ යුතුය.

(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 10 හි 20 ඡේදය ප්‍රකාරව සමාප්ති තත්ත්වය සැලකිල්ලට ගෙන අයභාරය සහ ආශ්‍රිත වියදම් හඳුනාගැනීම සිදු කළ යුතු වුවත් ආයතනය විසින් පුහුණු පාඨමාලා ආදායම හඳුනාගැනීමේදී ඒ අනුව කටයුතු නොකර පාඨමාලා ආදායම හඳුනාගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.5,154,360 ක් අඩුවෙන් දක්වා තිබුණි. තවද ප්‍රමිතියේ 39(අ) ඡේදය ප්‍රකාරව ආදායම හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය හෙළිදරව්කර නොතිබුණි. පාඨමාලා ලැබීම්වලින් රු.7,232,524 ක් 2025 වර්ෂයට අදාළව ලැබී තිබුණ ද එය කලින් ලද ආදායමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබීම නිසා සමාන ප්‍රමාණයකින් අතිරික්තය වැඩියෙන් හා ජංගම වගකීම් අඩුවෙන් දක්වා තිබුණි. 2024 වර්ෂයට අදාලව රු.7,281,724 ක් වූ ලැබියයුතු පාඨමාලා ආදායම රු.5,046,250 ක් ලෙස රු.2,235,474 ක් අඩුවෙන් හඳුනාගෙන ගිණුම්ගත කර තිබීමෙන් ජංගම වත්කම් හා අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 10 හි 20 ඡේදය අනුව 2025 වර්ෂය තුළදී අවසන් ගිණුම් සකස් කරන විට පුහුණු පාඨමාලාවන් ගේ සමාප්ති ක්‍රමය මත පදනම්ව පාඨමාලා ආදායම හඳුනාගෙන අදාල මූල්‍ය වර්ෂයට හිමි ආදායම, කලින් ලද ආදායම සහ ලැබිය යුතු පාඨමාලා ආදායම වශයෙන් ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ.	ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව නිවැරදිව පාඨමාලා ආදායම, කලින් ලද පාඨමාලා ආදායම, ලැබියයුතු පාඨමාලා ආදායම ගණනය කර ගිණුම්ගත කළ යුතුය. ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂය තුළ කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද රු.15,657,141 ක ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 ප්‍රකාරව වර්ෂයේ හුවමාරු නොවන ගණුදෙනුවලින් ලද ආදායමක් ලෙස හඳුනා නොගෙන විලම්බිත ආදායම් ලෙස ක්‍රමක්ෂය අඩුකළ අගයට හිමිකම් යටතේ දක්වා තිබුණි.	රේඛීය අමාත්‍යාංශයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.15,657,141 ක මුදලක් දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීමට ලබා දී තිබුණි. නමුත් මෙම මුදල ආයතනයේ මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ආදායමක් නොවන බැවින් එම ගනුදෙනු පාලන ගිණුමක් මගින් සටහන් කර ආයතනයේ දේපළ පිරියත සහ උපකරණවල ඉහළ යාමක් ලෙස ගිණුම් ගත කර ඇත.	ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ප්‍රාග්ධන ප්‍රදාන හුවමාරු නොවන ගණුදෙනුවලින් ලද ආදායමක් ලෙස හඳුනා ගත යුතුය.

1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

	විගණන නිරීක්ෂණය	කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ආයතනය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියක වියදම අධිකාරිය විසින් ප්‍රතිපූරණය කරනු ලබන අතර වර්ෂය තුළ දරන ලද රු.4,937,034 ක වියදම් සඳහා අධිකාරියෙන් රු.2,543,628 ක් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිපූරණය කර තිබුණි. මීට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබූ අතර ව්‍යාපෘතියට අදාල වියදම් හා ලැබෙන ප්‍රදාන පාලන ගිණුමක් හරහා ගිණුම්ගතකර වර්ෂ අවසාන ලැබිය යුතු ශේෂය ලෙස රු.2,015,285 ක් දක්වා තිබුණි.	මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන මධ්‍යස්ථාන තුනෙහි සියළු පාඨමාලාවන් නොමිලේ පවත්වනු ලබයි. මේ සඳහා මූල්‍ය පහසුකම් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මඟින් සපයයි. අධිකාරිය මඟින් ලැබෙන මුදල ආයතනයෙහි ආදායම ලෙස ගිණුම් ගත කලහොත් ආයතනයෙහි ආදායම කෘතිම ලෙස ඉහළ අගයක් පෙන්නුම් කරනු ඇත. එබැවින් මෙම ව්‍යාපෘතියේ ගනුදෙනුද පාලන ගිණුමක් මඟින් ගිණුම් ගත කර ඇත.	වෙනත් ආයතනවලින් ව්‍යාපෘති සඳහා ලැබෙන ආදායම් සහ වියදම් සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කළ යුතුය.
(ආ)	ආයතනයේ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් තැබීමේ ප්‍රතිපත්තිය අනුව ප්‍රාග්ධන ප්‍රදාන වලට අදාල ස්ථාවර වත්කම් ක්ෂය ප්‍රමාණයට සමානුපාතික ක්‍රමක්ෂය අගයක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට හඳුනා ගනු ලැබිය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබූ අතර විලම්බිත අදායම් ලෙස හිමිකම් යටතේ දක්වා තිබුණි. තවද විලම්බිත ආදායම් ගිණුමෙන් අඩුකර තිබූ ක්‍රමක්ෂය වටිනාකම රු.16,712,556ක් වුවද වර්ෂයේ ක්ෂය වෙන්කිරීම රු.28,240,553 වීමෙන් රු.11,527,997 ක වෙනසක් පැවතුණි.	ප්‍රවර්තන වර්ෂය තුළදී ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා නොදුන්නද, අදාළ ප්‍රාග්ධන ප්‍රතිපාදන මත ප්‍රවර්තන වර්ෂය තුලදී කටයුතු කිරීමට මහා භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව රු.16,712,556 ක ක්ෂය වීම් සහ රු.10,547,552 ක වෙනත් ප්‍රාග්ධන වියදම් විලම්බිත ආදායම් ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇත.	ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් තැබීමේ ප්‍රතිපත්තිය තීරණය කරගත යුතු අතර ඒ අනුව කටයුතු කළ යුතුය.

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසානයට අස්පෘශ්‍ය වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණ ද එහි වටිනාකම ලෙස රු.3,908,631 ක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි නිවැරදිව ඇතුලත් කිරිමට කටයුතු කරන අතර පරිගණක මෘදුකාංග සම්පූර්ණයෙන් ක්ෂය වි ඇති බැවින් 2025 වර්ෂයේදී එය ප්‍රත්‍යාගණනය කිරීමට ද කටයුතු කරනු ලැබේ.	සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල දළ ධාරන අගය හෙළිදරව් කළ යුතුය.
(ආ)	2022 සිට 2024 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ජංගම ගිණුමකට සෘජුවම බැර කර තිබූ රු.2,714,164 ක පාඨමාලා ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. ලැබිය යුතු පාඨමාලා ගාස්තු තුළ 2021 වර්ෂයේදී පියවා තිබූ රු.745,000 ක ශේෂයක් ඇතුලත්ව තිබීම හේතුවෙන් ජංගම වත්කම් ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	2022 හා 2023 වර්ෂයන් වලදී බැංකුව වෙත ලැබී ඇති සෘජු ප්‍රේෂණ සඳහා තව දුරටත් බැංකු තැන්පත් පත්‍රිකා ලැබෙමින් පවතී. එම වර්ෂවලදී සැසඳීමට ලක් නොවූ ප්‍රේෂණ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් 2025 වර්ෂයේ ආදායමට බැර කිරිමට හා 2021 වර්ෂයේ පියවා තිබූ රු.745,000 කට අදාළ ශේෂය ද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	වර්ෂයට අදාල පාඨමාලා ආදායම මෙන්ම ලැබිය යුතු ආදායමද නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

නොසැපයූ විගණන සාක්ෂි	කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සේවක ණය පොළිය සේවක ණය අරමුදලට මාරු කිරීමට අදාළ භාණ්ඩාගාර අනුමැතිය	2010 වර්ෂයේ දී මාණ්ඩලික පත්‍රිකා අංක 585 අනුව පිහිටුවන ලද අරමුදලක් වන අතර මේ සඳහා භාණ්ඩාගාර අනුමැතියක් ලබාගැනීමට කටයුතු කර නොමැත. කෙසේ වෙතත් ඉදිරියේදී එම අරමුදල අවසන් කිරිමට කටයුතු කරනු ලැබේ.	භාණ්ඩාගාර අනුමැතිය විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.

1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ ශේෂයෙහි 2024 දෙසැම්බර් 31 දිනට පැවති වසර 02 ඉක්මවා ඇති රු.3,122,150 ක් වූ ලැබිය යුතු පාඨමාලා ගාස්තු අය කර ගෙන නොතිබුණි.	වසර 02 ඉක්මවා ඇති 2020, 2021, 2022 වර්ෂයන් හි ලැබිය යුතු මෙම මුදල් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව පොත් වලින් කපා හැරීමට 2025 වර්ෂයේදී කටයුතු කරනු ලැබේ.	පොත් වලින් කපාහැරීමට ප්‍රථම ලැබිය යුතු මුදල් අය කර ගැනීමට උපරිම උත්සහය දැරිය යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 25(1)ඊ වගන්තිය, සහ 1995 ජූලි 28 දිනැති අංක 882 දරන ගැසට් නිවේදනයේ (6) වගන්තිය.	ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව පහකට වැඩි නොවිය යුතු වුවද 2025 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාව 06 ක් විය. එහිදී අධ්‍යක්ෂවරයෙකු ලෙස ගැසට් නිවේදනයෙන් නම් කර නොතිබූ කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු අධ්‍යක්ෂකවරයෙකු ලෙස පත්කර තිබුණි.	1995 ජූලි 28 දිනැති අංක 882 දරණ ගැසට් පත්‍රයේ 6 වෙනි වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය 5 කි. 2025 වසරේ පළමු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ලැබුණු උපදෙස් අනුව කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර ලේකම් නිරීක්ෂකවරියක ලෙස 2025 ජනවාරි, පෙබරවාරි, මාර්තු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගී කර ඇති අතර මෙම පත්වීම නිවැරදි කර දෙන මෙන් ඉල්ලා කර්මාන්ත හා ව්‍යාවසායකත්ව අමාත්‍යංශ ලේකම් වෙත ලිපියක් යොමු කර ඇත.	1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනතේ විධිවිධාන හා 1995 ජූලි 28 දිනැති අංක 882 දරන ගැසට් නිවේදනය පරිදි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින්	වැඩ බැලීමේ පත්කිරීමක් වසරක උපරිම කාලයකට සීමා කළ යුතු වුවද අධ්‍යක්ෂ ජනරාල් තනතුර හා අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර සඳහා වැඩබැලීමේ පත්වීම් ලබාදී	අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩ බැලීම වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025 අප්‍රේල් 30 දින වන තෙක් දීර්ඝ කර ඇත. ඉන් පසුව සිදු කරන වැඩ බැලීමේ පත් කිරීම්	කාර්ය පටිපාටික රීති ප්‍රකාරව තනතුරු සඳහා බඳවා ගැනීම් පටිපාටිය අනුගමනය කර සුදුසු නිලධාරින්

ප්‍රකාශයට පත්කර තිබුණු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 01 කොටස, 139 වගන්තිය	2024 දෙසැම්බර් 31 දින වන විට පිළිවෙලින් වර්ෂ 2 ක් හා වර්ෂ 3 ක් ගතවී තිබුණ ද එම තනතුරු සඳහා සුදුසු නිලධාරින් ස්ථිරව පත්කර නොතිබුණි.	කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත යැවීමට කටයුතු සලසා ඇත.	ස්ථිරව පත්කිරීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,919,535 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.5,796,846 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.877,311 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුහුණු පාඨමාලා ආදායම රු.5,295,225 කින් හා භාණ්ඩාගාර ප්‍රදාන රු.5,873,000 කින් වැඩි වුවද මිශ්‍ර ආදායම් රු.1,919,636 කින් අඩුවී තිබීමත් ජීවන වියදම් ගෙවීම් රු.6,812,220 කින් හා නඩත්තු වියදම් රු.1,530,471 කින් වැඩි වීමත් මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2017 - 2031 කාලය තුළ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 300.65 ක් වැයකර සිදු කරගෙන යාමට අපේක්ෂිත ශ්‍රී ලංකාව තුල මැණික් නිධි ගවේෂණය හා ඇගයීමේ ව්‍යාපෘතිය මඟින් දිස්ත්‍රික් 05ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 50 ක මැණික් නිධි ගවේෂණය සිදුකර වාර්තා සහ සිතියම් නිකුත් කිරීමට සැලසුම් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.30,589,687 ක් වැය කර දිස්ත්‍රික් 04 ක පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 17 ක ගවේෂණ කටයුතු කර භූමි ප්‍රදේශ 17 ක පමණක් වාර්තා සහ සිතියම් නිකුත් කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ ඉදිරි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමඟ විධිමත් එකඟතාවයකට එළඹ	කැබිනට් අනුමැතිය ලද මෙම ව්‍යාපෘති යෝජනාවට අනුව අවශ්‍ය ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට දිගින් දිගටම උත්සහ දැරුව ද මේ දක්වා එම අනුමැතීන් සහ ඊට අවශ්‍ය ප්‍රතිපාදන ලැබී නොමැත. ඒ හේතුවෙන් ආයතනයේ සිටි සුදුසු භූ විද්‍යාඥයන් තිදෙනා යොදවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සිදු විය. එම අයගෙන් දෙදෙනෙකු සේවයෙන් ඉවත්ව යාමත් එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අනුමැතිය නොලැබීමත් මත මේ වන විට ස්ථිර කාර්ය මණ්ඩලයේ එක් පර්යේෂණ නිලධාරියකුගෙන් පමණක් මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධව කටයුතු කිරීමට සිදු වීම හේතුවෙන් ව්‍යාපෘතිය තවදුරටත් ඉදිරියට කරගෙන යාම අපහසු කාර්යයක් වී ඇත. ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණයට අප ආයතනය වෙත බලතල පැවරී තිබුණද මෙමඟින් සොයා ගන්නා මැණික් විභව ඉඩම් වෙන්දේසි කිරීමට ආයතනය වෙත බලතල නොමැත. එබැවින් ඒ සඳහා බලතල දරන ජාතික මැණික් හා	සැලසුම් කර තිබූ පරිදි දිස්ත්‍රික් 05 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 50 ක මැණික් නිධි ගවේෂණය සිදු කර වාර්තා හා සිතියම් නිකුත් කිරීම් ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කළ යුතු අතර ඉදිරි කටයුතු සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමඟ නිසි සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කළ යුතුය.

	නොතිබීම හේතුවෙන් අදාල වාර්තා සහ සිතියම් සහිත ඉඩම් වෙන්දේසි කිරීම සහ බලපත්‍ර ලබාදීම දක්වා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද 2017 සිට 2021 දක්වා කාලය තුලදී ව්‍යාපෘතිය මගින් හඳුනාගත් මැණික් විභව ස්ථාන වෙන්දේසියෙන් උපයාගනු ලබන මුදල් රු.මිලියන 174.15 ක් 2022 සිට 2031 දක්වා කාලය තුලදී සිදු කරනු ලබන පර්යේෂණවල දෙවන හා තුන්වන අදියරවල වියදම් දැරීමට පුරෝකථනය කර ඇති නමුත් පර්යේෂණවලින් හඳුනාගත් මැණික් විභව ඉඩම් 2022 හා 2023 වර්ෂවලදී වෙන්දේසි කර ඉන් අදායම් උපයා නොතිබුණි.	ස්වර්ණාභරණ අධිකාරිය වෙත අදාළ මැණික් විභව ඉඩම්වල විස්තර ලබා දීමට කටයුතු කෙරිණි. අමාත්‍යාංශයේ ද මැදිහත් වීමෙන් මේ සම්බන්ධව අධ්‍යනය කර වාර්තාවක් සකස් කර ඉදිරිපත් කිරීමට ආයතනයේ සභාපතිවරයාගේ සභාපතිත්වයෙන් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්, එහි නිලධාරීන් සහ ආයතනයේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරන ලදී. එම කමිටුවේ කටයුතු අධිකාරිය මඟින් සිදු කෙරෙමින් පවතී.	
(ආ)	ඉහළ යන ඉල්ලුමක් සහිත විෂය ක්ෂේත්‍ර හඳුනා ගනිමින් ඊට අදාළ පුහුණු පාඨමාලා 21 ක විෂයමාලා, සංවර්ධනය කර තිබුණ ද වර්ෂය තුළ ශිෂ්‍යයන් බඳවාගෙන ක්‍රියාත්මක කර තිබුණේ පාඨමාලා 14 ක් සඳහා පමණක් වූ අතර පාඨමාලා 7ක් සඳහා කිසිම අපේක්ෂකයෙකු බඳවාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ මෙම පාඨමාලා 14 සඳහා බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව ඉකුත් වර්ෂයට සාපේක්ෂව 1,577 සිට 1,334 දක්වා සියයට 14 කින් අඩුවී තිබුණි. පෙර වර්ෂයේ ක්‍රියාත්මක කර තිබුණු මැණික් වර්ණ ශ්‍රේණිගත කිරීම් හා අලෙවිකරණ පාඨමාලාව, මැණික් මිල තක්සේරුකරණය හා අලෙවිකරණය, ස්වර්ණාභරණ ඩිප්ලෝමාව යන පුහුණු පාඨමාලා පවත්වා නොතිබුණි.	මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාලව දේශීය හා විදේශීය වෙළඳපොළ සමීක්ෂණ අනුව වැඩි ඉල්ලුමක් හා වෘත්තීයභාවයක් සහිත පුහුණු පාඨමාලා 21 ක් තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රමිතිවලට අනුකූලව සකස් කර ඇත. විෂයය ක්ෂ්ත්‍රයට අදාලව නිපුණතාවය අනුව පාඨමාලා කාණ්ඩ කිහිපයක් යටතේ පාඨමාලා සැලසුම් වී ඇත. එසේම මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාළව ඇතැම් පාඨමාලා සඳහා ඇති ඉල්ලුම අඩු වීම කාලීනව උච්චාවචනය වේ. එසේම පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම සඳහා පවතින සීමිත පරිශ්‍ර පහසුකම් හා අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල ස්ථිර/ බාහිර හිඟතාවය හේතුවෙන්ද මෙසේ පාඨමාලා සීමා කිරීමට සිදු වී තිබේ.	සැලසුම් කළ පරිදි පාඨමාලා ක්‍රියාත්මක කර ශිෂ්‍යයන් බඳවා ගැනීම තුලින් ආයතනයේ ළඟා කර ගත යුතුය.
(ඇ)	ආයතනික වෙබ් අඩවිය වර්තමානයට ගැළපෙන	දැනට ඇන හිට පවතින 2010 දී සකස් කරන ලද ආයතනික වෙබ් අඩවිය	ආයතනයේ වෙබ් අඩවිය යාවත්කාලීනව

ආකාරයට හා වර්තමාන තත්ත්වයන් සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් කර යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.	ප්‍රතිනිර්මාණය කිරීම වෙනුවෙන් ව්‍යාපෘති යෝජනාවක් සකස් කර 2025 වර්ෂයේ වාර්ෂික ප්‍රතිපාදන වෙන්කර මේ වන විට අමාත්‍යාංශ නියෝජිතයෙකුගෙන් සමන්විත කමිටුවක් හරහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ Telecom (Services) Ltd වෙත ටෙන්ඩරය පිරිනමා ඇත.	පවත්වාගත යුතුය.

3.3 අරමුදල් ඌන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයතනයේ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය ඉදිකිරීම සඳහා රු.14,204,402ක් වැය කර 30 අවුරුදු බදු පදනම මත ලබාගත් ඉඩමෙහි සමාලෝචිත වර්ෂය අවසානය වන විටද ඉදිකිරීම් ආරම්භ නොකිරීම හේතුවෙන් ඉඩම වසර 08 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.	මෙම ඉඩමෙහි ගොඩනැගිල්ලක් සාදා නිම කිරීමේ අරමුණින් 2021-2025 පස් අවුරුදු සැලැස්මටද එය ඇතුළත් කරන ලදී. රටේ පැවැති කොරෝනා වසංගත තත්ත්වය හා පැන නැගුණු සමාජීය හා ආර්ථික තත්ත්වය තුළ රාජ්‍ය වියදම් සීමා කිරීමත් හේතුවෙන් ඉඩමෙහි ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමේ නොහැකියාව මත මෙහි ඉදිරි කටයුතු ප්‍රමාද වී ඇත.	ඉඩම මිලදී ගැනීමේ අරමුණ ඉටුකර ගැනීමට අදාළව කටයුතු සැළසුම් කර ක්‍රියාත්මක කළ යුතුය.
(ආ)	මැණික් පිළිස්සීම සඳහා 2013 වර්ෂයේදී රු.10,977,344 කට විදුලි උඳුනක් මිලදී ගෙන වර්ෂ 06 ක කාලයක් නිෂ්කාර්යව පැවතුණු අතර 2020- 2021 කාලය තුළ රු.3,953,540 ක මුදලක් වැයකර අමතර කොටස් සහ විදුලි පරිපථ යොදා යන්ත්‍රය වැඩිදියුණු කර තිබුණි. 2020 - 2021 කාලය තුළ පර්යේෂණ ධාවන වාර 05 කට පමණක් යන්ත්‍රය භාවිතා කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් යන්ත්‍රය අක්‍රියව පැවතුණි.	මෙම විදුලි උඳුන මිලදී ගෙන රත්නපුර මධ්‍යස්ථානයේ ස්ථාපිත කර තිබුනද එය ක්‍රියාත්මක කිරීම අවශ්‍ය විදුලි සැපයුම් ධාරිතාවක් හා විදුලි ජනක යන්ත්‍රයක් නොතිබීම මත පර්යේෂණ කටයුතු සඳහා භාවිතා කිරීමට නොහැකි වීම නිසා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ රත්නපුර මධ්‍යස්ථානයේ මෙම උඳුන ස්ථාපනය කිරීමට අවශ්‍ය විදුලි ජනක යන්ත්‍රය සපයා දීමටත් එකඟ විය. 2020 වර්ෂයේ සිට පර්යේෂණ කටයුතු සඳහා මෙම උඳුන සාර්ථකව යොදාගත්තද මේ වන විට වසර 12ක් පමණ පැරණි උඳුනේ ප්‍රධාන පුවරුවෙහි පාලක ඒකකය දෝශ සහගත වීම මත උඳුන ක්‍රියාත්මක තත්ත්වයේ නොමැත. එම කොටස් සේවා ගිවිසුමකට යටත්ව උඳුනෙහි සැපයුම්කරු හරහා මව් ආයතනයෙන් ප්‍රතිස්ථාපනය කිරීමේ ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී.	වත්කම් නිසි ක්‍රියාකාරී තත්ත්වයෙන් පවත්වාගනිමින් මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය.

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර 2011 ජුනි මස කාර්ය මණ්ඩලය අනුමත දින සිටම පුරප්පාඩු වී තිබූ අතර පර්යේෂණ කටයුතු සඳහා අනුමත ජොෂ්ඨ තනතුරු 19 කින් 15ක් පුරප්පාඩුව පැවතුණි. තවද පර්යේෂණ කටයුතු සඳහා අනුමත මුළු තනතුරු 50 න් 42 ක් එනම් සියයට 84 ක් පුරප්පාඩු වී තිබීම ආයතනයේ ප්‍රධානතම කාර්ය ක්ෂේත්‍රය වන පර්යේෂණ කටයුතු සාර්ථකව සිදු කිරීම සඳහා බාධාවක්ව පැවතුණි.	ආයතනයේ කාර්ය මණ්ඩලය අනුමත දින සිටම පුරප්පාඩු වී ඇත. තාවකාලික පදනම මත හෝ පර්යේෂණ නිළධාරීන් 03, කථිකාචාර්යවරුන් 02 හා කළමණාකරණ සහකාරවරුන් 02ක් බඳවා ගැනීමටද කටයුතු කළ අතර මේ සම්බන්ධව අමාත්‍යාංශය මඟින් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කළ අවස්ථාවේ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය ඒකාබද්ධ කිරීමේ කටයුතු අවසන් වන තෙක් මෙම බඳවා ගැනීම සිදු නොකරන ලෙස උපදෙස් ලබා දී ඇත .	බඳවා ගැනීම් පටිපාටිය ප්‍රකාරව සුදුසු නිලධාරීන් බඳවාගෙන පර්යේෂණවලට අදාළ ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	ආයතනයේ පුහුණු කාර්යයන් සඳහා අනුමත ජොෂ්ඨ පුහුණු නිලධාරී තනතුරු 06 ක්, දේශක තනතුරු 04 ක් සහ පුහුණු නිලධාරී තනතුරු 23 න් 10 ක් පුරප්පාඩු වී තිබීම ආයතනයේ පුහුණු කාර්යන් ඉටුකිරීම කෙරෙහි අයහපත් අයුරින් බලපා තිබුණි. අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන) දරන නිලධාරියා වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත්කර තිබීම හේතුවෙන් ආයතනයේ පුහුණු කාර්යයන් සඳහා ඔහුගේ දායකත්වය ලබාගැනීමට නොහැකිව තිබුණි. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය තාක්ෂණික, ශිල්පිය හා වෙළඳපළ අංශයන්ගෙන් වර්තමානයේ විශාල ලෙස පරිවර්තනයට ලක්වී තිබීම හේතුවෙන් ඊට සරිලන අධ්‍යාපන සුදුසුකම්වලින් යුක්ත වූ අධ්‍යයන කාර්ය මණ්ඩලයක් සිටීම අත්‍යවශ්‍ය වුවද, පුහුණු අංශයේ සේවා නියුක්තව ඇති සේවකයින් වැඩි පිරිසක් සහතික පත්‍ර පාඨමාලා හැදෑරූ සාමාන්‍ය ශිල්පීය කුසලතා	ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය ඒකාබද්ධ කිරීමේ කටයුතු අවසන් වන තෙක් මෙම බඳවා ගැනීම සිදු නොකරන ලෙස කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව උපදෙස් ලබා දී ඇත. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල තාක්ෂණික හා විධිමත් දැනුමින් යුත් උසස් අධ්‍යාපනයක් සහිත පිරිස සිටිනුයේ ඉතා අවම මට්ටමකිනි. නමුත් ආයතනය විසින් හැකිතාක් පාඨමාලා මෙහෙයවීම සඳහා උපාධි , පශ්චාත් උපාධි (Diplomas, Masters, PhD) මට්ටමේ සීමිත බාහිර පුහුණු නිලධාරීන් බඳවා ගැනිමට කටයුතු කරනු ලබයි. මෙම කර්මාන්තයට අදාළව උපාධි සුදුසුකම ලබා ගැනීමට හැකි පරිදි උපාධි පාඨමාලාවක් ද නිර්මාණය කරමින් පවතින අතර 2024 වසරේ සිට මෙම කර්මාන්තයේ ජාත්‍යන්තර සුදුසුකම වන බ්‍රිතාන්‍ය රත්නවිද්‍යා සුදුසුකම (Gem - a – Fellowship of Great Britain) හැදෑරීමේ පහසකම් ද ආරම්භ කොට සාර්ථකව ක්‍රියාත්මක කරගෙන යනු ලබයි.	බඳවා ගැනීමේ පරිපාටිය අනුව සුදුසු නිලධාරීන් බඳවාගෙන ආයතනික අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා පුහුණු කාර්යයන් ඉහල කාර්යසාධනයකින් ඉටු කළ යුතුය.

සහිත කාර්ය මණ්ඩලයක් වීම හේතුවෙන් නව තාක්ෂණික ක්‍රම හා ශිල්පීය ක්‍රම පිළිබඳ පුහුණුවක් සහිතව පුහුණු කිරීම් සිදු කිරීම අභියෝගයට ලක්වී තිබුණි.